# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 ඔක්තෝබර් 16 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.10.16 දින නිකුත් කරන ලදී)


# සිවිල් නඩු විධාන සංග්‍රහය
# (සංශෝධන)

**(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**


අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 130.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 167අ සිට 167බ දක්වා වූ වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම ඇතුළත් කළ වගන්තිවල නීතියේ බලපෑම වනුයේ සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක හරහා
ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ඕනෑම තැනක සිට සාක්ෂිකරුවකු විසින් ස්වකීය සාක්ෂිය ලබාදීම සඳහා පහසුකම් සැලැස්වීම සහ ඒ හා සම්බන්ධ වෙනත් කාරණා වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධනය 167ආ වගන්තිය මගින් සිදු කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

එල්. ඩී.- ඕ. 10/2022

## (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2026 අංක  දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර මේ පනතේ සෙසු විධිවිධාන, (මෙහි මින් මතු "නම් කළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකි දිනයක දී සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

101 වන අධිකාරයට 167අ, 167ආ, 167ඇ, 167ඈ, 167ඉ, 167ඊ, 167උ, 167ඌ, 167එ, 167ඒ, 167ඔ, 167ඕ, 167ක, 167ග, 167ච, 167ජ, 167ට, 167ඩ, 167ණ, 167ත, 167ද, 167න, 167ප සහ 167බ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 167 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 167අ, 167ආ, 167ඇ, 167ඈ, 167ඉ, 167ඊ, 167උ, 167ඌ, 167එ, 167ඒ, 167ඔ, 167ඕ, 167ක, 167ග, 167ච, 167ජ, 167ට, 167ඩ, 167ණ, 167ත, 167ද, 167න, 167ප සහ 167බ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

"විධාන නිකුත් කිරීම සඳහා අධිකරණය සතු බලය

**167අ.** (1) 167 වන වගන්තියේ විධිවිධානවල සහ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, අධිකරණය විසින්-

(අ) නඩුවේ සියලු පාර්ශ්වයන්ගේ එකඟතාවය මත;

PL 15937 - 465 (2026/09)

(ආ) නඩුවේ පාර්ශ්වයක් විසින් කරන ලද ඉල්ලීමක් මත; හෝ

(ඇ) නඩුවකදී ස්වකීය මෙහෙයවීමෙන් ම,

සහ (2) වන හා (3) වන උපවගන්තිවලට යටත්ව, සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම දුරස්ථ ස්ථානයක පිහිටි තැනක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සිදුකිරීමට විධාන කළ හැකි ය.

(2) සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සිදුකිරීමට විධාන කිරීමට පෙර, අධිකරණය විසින් පාර්ශ්වයන්ගේ හෝ සාක්ෂිකරුගේ යම් ගැටලු හෝ විරෝධතා සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) (අ) යුක්තිය පසිඳලීමේ යහපත සඳහා වන බවට;

(ආ) අධිකරණ ස්ථානය තුළ සිටින නඩුවේ යම් පාර්ශ්වයකට අසාධාරණයක් නොවිය හැකි බවට;

(ඇ) සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා කරගෙන යා හැකි බවට වන දැන්වීම සියලු පාර්ශ්වයන්ට ලැබුණු බවට; සහ

(ඈ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් පවතින බවට හෝ ප්‍රමාණවත් ලෙස ලබා ගැනීමට සැලැස්විය හැකි බවට,

අධිකරණය සෑහීමට පත්වන්නේ නම් මිස, අධිකරණය විසින් සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සිදු කරන ලෙසට විධාන නොකළ යුතු ය.

නඩුවේ සියලු පාර්ශ්වයන්ගේ එකඟතාවය

**167ආ.** (1) 167අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ සියලු පාර්ශ්වයන්ගේ එකඟතාවය මත දුරස්ථ ස්ථානයක පිහිටි තැනක සිට සමකාලීන ශ්‍රව්‍යදෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි ලබාදීමට අදහස් කරනු ලබන පාර්ශ්වය විසින් අධිකරණයේ විධානය ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක්, සාක්ෂිකරුගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය, දුරකථන අංකය සහ සාක්ෂිකරුගේ භාෂාව, සිටින ස්ථානය සහ සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා දෙනු ලබන දුරස්ථ ස්ථානයේ තැන මෙන්ම සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා නම් කළ යුතු තැනැත්තාගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය, දුරකථන අංකය ඇතුළත් විය යුතු සාක්ෂිකරුවකුගේ සාක්ෂි සමකාලීන ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්බන්ධකයක් හරහා ලබා ගැනීම සඳහා කැමැත්ත පළකරමින් නඩුවේ සියලු පාර්ශ්වයන් විසින් අත්සන් කරන ලද මෝසමක් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විධානය කිරීමෙන් පසුව, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා යම් තැනැත්තකු නම් කිරීමට නඩුවේ පාර්ශ්වයන් එකඟ වන අවස්ථාවක දී, අධිකරණය විසින් ඒ තැනැත්තා දුරස්ථ ස්ථානයේ කොමසාරිස්වරයා ලෙස පත්කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ විධානය කිරීමෙන් පසුව-

(අ) පාර්ශ්වයන්ගේ හුදු පහසුව සඳහා නොවන යම් වලංගු හේතුවක් මත, කොමසාරිස්වරයකු පත් කිරීමකින් තොරව, ශ්‍රී ලංකාවෙන් පිටත දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීමට නඩුවේ පාර්ශ්වකරුවන් විසින් ලිඛිතව එකඟ වී ඇති අවස්ථාවක දී; සහ

(ආ) දුරස්ථ විභාග කිරීම සඳහා විශේෂිත වැඩපිළිවෙල සම්බන්ධයෙන් විධිමත් කරුණු විමසීමක දී පාර්ශ්වකරුවන් විමසීමෙන් පසුව සහ නඩු විභාග කටයුතුවල සමස්ත සාධාරණත්වය, සාක්ෂිකරුගේ අනන්‍යතාවය, ස්ථානය, දත්ත ආරක්ෂාව සහ රහස්‍යභාවය සහතික කිරීම සඳහා වන විධානවලට යටත්ව කොමසාරිස්වරයකු පත්කිරීමකින් තොරව, එම සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීම සුදුසු සහ සාධාරණ වන බවට අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක දී,

කොමසාරිස්වරයකු පත්කිරීමකින් තොරව අධිකරණයේ අධීක්ෂණය සහ විධාන යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීමට අධිකරණය විසින් අවසර ලබා දිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ විධානය කිරීමෙන් පසුව, නඩුවේ පාර්ශ්වයන් එවැනි තැනැත්තෙකු නම් කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අධිකරණය විසින් පහත උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා දූරස්ථ ස්ථානයක කොමසාරිස්වරයකු පත්කරනු ලැබිය යුතු ය.

(6) සාක්ෂි ලබා දිය යුතු යම් සාක්ෂිකරුවකු රජයේ ආයතනයක සේවානියුක්තයකු වන අවස්ථාවක දී, ලබාදිය යුතු සාක්ෂි ඒ සේවානියුක්තයාට පවරන ලද නිල කාර්යයකට අදාළව සහ ඒ සේවානියුක්තයා සේවයේ නියුතු රජයේ ආයතනයේ සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් පවතින අවස්ථාවක දී, රජයේ ආයතනයේ ප්‍රධානියා හෝ ඒ ආයතන ප්‍රධානියා විසින් නම් කරන ලද වෙනත් යම් නිලධරයකු කොමසාරිස්වරයා විය යුතු ය.

(7) සාක්ෂි ලබාදිය යුතු සාක්ෂිකරුවකු ශ්‍රී ලංකාවෙන් පිටත සිටින අවස්ථාවක දී -

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත දූරස්ථ ස්ථානයේ එවැනි තැන ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලයේ, තානාපති කාර්යාලයේ හෝ කොන්සල් කාර්යාලයේ රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකු ශ්‍රී ලංකාවෙන් පිටත දූරස්ථ ස්ථානයේ කොමසාරිස්වරයා ලෙස අධිකරණය විසින් පත්කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) යම් හේතුවක් මත ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලයක්, තානාපති කාර්යාලයක් හෝ කොන්සල් කාර්යාලයක් හෝ රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකු නොමැති අවස්ථාවක දී, එම විධානය නිකුත් කරනු ලබන්නේ නඩුවේ යම් පාර්ශ්වයක් වෙත ද ඒ පාර්ශ්වය විසින් නම් කරන ලද යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් පිටත දුරස්ථ ස්ථානයේ කොමසාරිස්වරයා වශයෙන් අධිකරණය විසින් පත් කරනු ලැබිය හැකි ය. ඒ තැනැත්තා අධිකරණයක් ඉදිරියේ නීතිඥ වෘත්තියෙහි යෙදීමට අවසර ඇති තැනැත්තකු, දිවුරුම් කොමසාරිස්වරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ එම විදේශ අධිකරණ බලප්‍රදේශයේ එවැනි සමාන තනතුරක් දරන තැනැත්තකු විය යුතු ය. නම් කිරීම සිදු කරනු ලබන පාර්ශ්වය විසින් කොමසාරිස්වරයකු වශයෙන් නම් කරනු ලැබිය යුතු තැනැත්තාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය හෝ විද්‍යුත් තැපැල් ලිපිනය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(8) කොමසාරිස්වරයකු පත්කිරීම මේ සංග්‍රහයේ පළමුවන උපලේඛනයේ 39අ වන ආකෘතියට සාරානුකූලව සිදු කරනු ලැබිය යුතු ය.

(9) අධිකරණයේ රෙජිස්ට්‍රාර් හෝ අධිකරණය විසින් නම්කරන ලද නිලධරයකු අධිකරණ ස්ථානයේ උසාවි නිලධරයා විය යුතු ය.

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබාදීම හෝ සාක්ෂිකරුවකු විභාග කිරීම සඳහා පාර්ශ්වයක් විසින් කරනු ලබන ඒකපාර්ශ්වීය ඉල්ලීම

**167ඇ.** (1) 167අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි ලබා දීමට අදහස් කරන යම් පාර්ශ්වයක් විසින් සාක්ෂිකරුගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය, දුරකථන අංකය සහ සාක්ෂිකරුගේ භාෂාව, සාක්ෂිකරු සිටින ස්ථානය සහ සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා දෙනු ලබන දුරස්ථ ස්ථානයේ තැන ඇතුළත්ව දුරස්ථ ස්ථානයක පිහිටි තැනක සිට සාක්ෂි ලබාදෙනු ලබන සාක්ෂිකරු හඳුනාගැනීමට අදාළ විය හැකි පරිදි තොරතුරු අන්තර්ගත වන්නා වූ දැන්වීමක් විරුද්ධ පාර්ශ්වය වෙත ලබාදීමෙන් පසුව යම් දුරස්ථ ස්ථානයක සිටින සාක්ෂිකරුවකුට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබාදීම සඳහා අධිකරණයේ විධානයක් සඳහා ලිඛිත මෝසමක් මගින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) එම ඉල්ලීම සලකා බැලීමෙන් පසුව, අධිකරණය එම ඉල්ලීමට අවසරදීමට තීරණය කරන අවස්ථාවක දී, අධිකරණය විසින් දුරස්ථ ස්ථානයේ කොමසාරිස්වරයා සහ අධිකරණ ස්ථානයේ උසාවි නිලධරයා පත්කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කිරීමෙන් පසුව සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි ලබාදීමට අදහස් කරන පාර්ශ්වය විසින් දුරස්ථ ස්ථානයේ සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කිරීමට යම් තැනැත්තකුගේ

අදාළ විය හැකි පරිදි නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය සහ දුරකථන අංකය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) 167ආ වන වගන්තියේ (3) වන, (5) වන, (6) වන, (7) වන, (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධාන කොමසාරිස්වරයා සහ උසාවි නිලධරයා පත්කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

අධිකරණ සිය මෙහෙයවීමෙන් විධාන කළ හැකි බව

**167ඇ.** (1) සාක්ෂිකරුවකුගේ සාක්ෂි දුරස්ථ ස්ථානයක පිහිටි තැනක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා ලබාදිය යුතු බවට 167අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක දී, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අධිකරණය විසින් පාර්ශ්වයට විධාන කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධානයක් කිරීමෙන් පසුව අධිකරණය විසින් දුරස්ථ ස්ථානයේ කොමසාරිස්වරයා සහ අධිකරණ ස්ථානයේ උසාවි නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

(3) 167ආ වන වගන්තියේ (5) වන, (6) වන, (7) වන, (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධාන කොමසාරිස්වරයා සහ උසාවි නිලධරයා පත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

සාක්ෂිකරුවකු රෝගාතුර වීම හෝ සාක්ෂිකරුවකුගේ අශක්නුතාවයක් සම්බන්ධයෙන් වන විට දී

**167ඉ.** අධිකරණය විසින් 167ආ වන, 167ඇ වන හෝ 167ඈ වන වගන්ති යටතේ විධානයක් නිකුත් කර ඇති සහ රෝගාතුර වීමක් හෝ අශක්නුතාවයක් හේතුවෙන් සාක්ෂිකරුවකුට අධිකරණයට පැමිණීමට නොහැකි වන බවට විනිශ්චයකාරවරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, කොමසාරිස්වරයා විසින් විනිශ්චයකාරවරයාගේ

යම් වැඩිදුර විධානයකට යටත්ව සාක්ෂිකරු පදිංචි නිවසට හෝ වෙනත් යම් ස්ථානයකට හෝ ගොස් ඒ සාක්ෂිකරුගේ සාක්ෂි සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා විභාග කිරීම සම්බන්ධීකරණය කරනු ලැබිය හැකි ය.

අධිකාර පත්‍ර නිකුත් කිරීම

**167ඊ.** (1) (අ) සාක්ෂිකරු රජයේ ආයතනයක සේවානියුක්තයකු නොවන අවස්ථාවක දී, ශ්‍රී ලංකාව ඇතුළත දුරස්ථ ස්ථානයක සිටින කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි තැපෑල, කුරියර් සේවාව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් මේ සංග්‍රහයේ පළමු වන උපලේඛනයේ අංක 39ආ වන ආකෘතියෙන් යුතුව; සහ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි දුරස්ථ ස්ථානයක සිටින කොමසාරිස්වරයාට ලියාපදිංචි තැපෑල, කුරියර් සේවාව, ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් හෝ විදේශ දූත මණ්ඩලයක් හෝ මධ්‍යම අධිකාරිය හරහා මේ සංග්‍රහයේ පළමුවන උපලේඛනයේ අංක 39ඇ වන ආකෘතියෙන් යුතුව,

අධිකරණය විසින් අධිකාර පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා ස්වකීය සාක්ෂි ලබා දීමට බලාපොරොත්තු වන සාක්ෂිකරුවකු රජයේ ආයතනයක සේවා නියුක්තයකු වන අවස්ථාවක දී, ඒ අධිකාර පත්‍රය

ආයතන ප්‍රධානියා වෙත හෝ රජයේ ආයතනයේ ප්‍රධානියා විසින් නම් කරන වෙනත් යම් නිලධරයකු වෙත ලියාපදිංචි තැපැල, කුරියර් සේවාව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් භාරදෙනු ලැබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් අධිකාරි පත්‍රයේ පිටපතක් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා ස්වකීය සාක්ෂි ලබා දීමට බලාපොරොත්තු වන සාක්ෂිකරු වෙත, එකී සාක්ෂිකරුට භාර දීමට නියමිත සිතාසි ද සමඟ යවනු ලැබිය යුතු ය.

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරුවකුට සහාය වීම සඳහා භාෂා පරිවර්තකයන්, භාෂණ පරිවර්තකයන් ආදීන් පත් කිරීම

**167උ.** (1) අධිකරණය විසින් පාර්ශ්වයක යම් ඉල්ලීමක් මත හෝ සිය මෙහෙයවීමෙන්ම සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරුවකුට සහාය වීම සඳහා පහත දැක්වෙන තැනැත්තන් පත්කරනු ලැබිය හැකි ය:-

(අ) සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරු අධිකරණයේ භාෂාව නොදන්නා අවස්ථාවක දී භාෂා පරිවර්තකයකු;

(ආ) සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරු ශ්‍රවණ හෝ කථන ආබාධයක් සහිත අවස්ථාවක දී භාෂණ පරිවර්තකයකු;

(ඇ) සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරු දෘශ්‍ය ආබාධයක් සහිත වන අවස්ථාවක දී ලේඛන කියවීම සඳහා විශේෂඥයකු; හෝ

(ඈ) සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරු තාවකාලිකව හෝ ස්ථිර මානසික හෝ කායික දුබලතාවයකින් පෙළෙන අවස්ථාවක දී භාෂණ

පරිවර්තකයකු, භාෂා පරිවර්තකයකු, හෝ විශේෂයෙන් පුහුණු කරන ලද අධ්‍යාපනඥයකු.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන භාෂා පරිවර්තකයකු, භාෂණ පරිවර්තකයකු, විශේෂඥයකු හෝ අධ්‍යාපනඥයකු එසේ භාෂා පරිවර්තකයකු, භාෂණ පරිවර්තකයකු, විශේෂඥයකු හෝ අධ්‍යාපනඥයකු වශයෙන් තම කාර්ය ඉටු කිරීම සඳහා සුදුසුකම් සහිත තැනැත්තකු විය යුතු ය.

නිරීක්ෂකයකු පත් කිරීම

**167ඌ.** (1) අනෙක් පාර්ශ්වය වෙත පිටපතක් සහිතව අධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත, ශ්‍රී ලංකාව තුළ දුරස්ථ ස්ථානයේ දී නීතිඥවරයකු විය යුතු නිරීක්ෂකයකු නම් කිරීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දුරස්ථ ස්ථානයක සිටින සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී ඒ විදේශ අධිකරණ බල ප්‍රදේශයේ අධිකරණයක් ඉදිරියේ වෘත්තියෙහි යෙදීමට අවසර ඇති යම් තැනැත්තකු වන නිරීක්ෂකයකු නම් කිරීම සඳහා අධිකරණය විසින් විරුද්ධ පාර්ශ්වයට අවසර දෙනු ලැබිය හැකි ය.

(2) ඉල්ලීමට අවසර ලැබීමෙන් පසුව, ඉල්ලුම්කරු විසින් නිරීක්ෂකයාගේ නම සහ වෙනත් විස්තර කොමසාරිස්වරයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

ලේඛන, ලියවිලි හෝ ප්‍රදර්ශිත හුවමාරු කිරීම සහ ඉදිරිපත් කිරීම

**167එ.** ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වන ලේඛන ඇතුළු ලේඛන, ලියවිලි හෝ ප්‍රදර්ශිත භාවිත කළ යුතුව ඇති අවස්ථාවක දී, සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීමට පෙර හෝ විභාග කරන අතරතුර දී ඒ ලේඛන, ලියවිලි හෝ ප්‍රදර්ශිත විධිමත්ව හුවමාරු කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා සුදුසු මාධ්‍යයක් පිළිබඳව පාර්ශ්වයන් විසින් එකඟ

වී එම මාධ්‍යය සූදානම් කරනු ලැබිය යුතු අතර, එසේ එකඟ වීමට පාර්ශ්වයන් අපොහොසත් වන අවස්ථාවක දී අධිකරණය විසින් අවශ්‍ය නියෝග කරනු ලැබිය හැකි ය.

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සඳහා දිනයක්, වේලාවක් සහ දුරස්ථ ස්ථානයේ පිහිටි තැනක් නියම කිරීම

**167ඒ.** (1) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි ලබා දීමට අධිකරණය විධාන කරනු ලබන අවස්ථාවක දී විනිශ්චයකාරවරයා විසින් අවස්ථාවෝචිත පරිදි කොමසාරිස්වරයා, උසාවි නිලධරයා සහ පාර්ශ්ව විමසා සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීම සඳහා දිනයක්, වේලාවක් සහ දුරස්ථ ස්ථානයේ පිහිටි තැනක් නියම කරනු ලැබිය යුතු ය.

(2) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකු කැඳවනු ලබන යම් පාර්ශ්වයක් විසින් (1) වන උපවගන්තිය ප්‍රකාරව නියම කරන ලද දිනය, වේලාව සහ දුරස්ථ ස්ථානයේ පිහිටි තැන වහාම සාක්ෂිකරුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ දිනයක් නියම කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාව ඇතුළත සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා දීමට සිටින සාක්ෂිකරු වෙත දිනය, වේලාව සහ දුරස්ථ ස්ථානයක පිහිටි තැන දන්වමින් සිතාසි භාර දීම සඳහා අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(4) අධිකාර පත්‍රයක් භාරදීම සම්බන්ධයෙන් වන 167ඊ වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ශ්‍රී ලංකාවෙන් පිටත සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි ලබා දෙන්නා වූ යම් සාක්ෂිකරුවකුට සිතාසි භාරදීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(5) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි ලබා දීමට හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට තැනැත්තකුගේ පැමිණීම සඳහා වන සෑම සිතාසියක් ම -

(අ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා දීමේ හෝ ලේඛනයන් ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා හෝ ඒ කාර්යයන් දෙක සඳහා ම ඔහු පැමිණීමට නියමිත දිනය, වේලාව සහ දුරස්ථ ස්ථානයේ පිහිටි තැන නිශ්චිතව දැක්විය යුතු ය;

(ආ) යම් නිශ්චිත ලේඛනයක් නිශ්චිතව දැක්විය යුතු අතර, එය සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව විස්තර කළ යුතු ය; සහ

(ඇ) අනන්‍යතාවය ඔප්පු කිරීමේ විස්තර සමඟ දුරස්ථ ස්ථානයට පෞද්ගලිකව ම පැමිණෙන ලෙස සාක්ෂිකරුට විධාන කළ යුතු ය.

සාක්ෂිකරුවකුගේ සාක්ෂි සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා විභාග කිරීමේ දී සහභාගීවන්නන්

**167ඔ.**(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධානවලට යටත්ව සාක්ෂිකරුවකුගේ සාක්ෂි සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා විභාග කිරීම අධිකරණයේ දී භෞතිකව පවත්වනු ලබන නඩු කටයුත්තක් ආකාරයෙන් ප්‍රසිද්ධියේ සිදු කරනු ලැබිය යුතු ය.

(2) පහත දැක්වෙන තැනැත්තන්ට අධිකරණ ස්ථානයක සිට සහභාගී වීමට හිමිකම් ලැබිය යුතු ය:-

(අ) නඩුවේ පාර්ශ්වයන් හෝ ඔවුන්ගේ නීතිඥවරු හෝ එම පාර්ශ්වයක් සහ ඔවුන්ගේ නීතිඥවරු;

(ආ) 167උ වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන භාෂා පරිවර්තක, භාෂණ පරිවර්තක, විශේෂඥ හෝ විශේෂයෙන් පුහුණු කරන ලද අධ්‍යාපනඥ හෝ ඒ සියල්ලන් ම;

(ඇ) සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීමේ දිනය සහ වේලාව තීරණය කරනු ලබන අවස්ථාවේ දී විනිශ්චයකාරවරයා විසින් අවසරය දෙනු ලබන වෙනත් යම් තැනැත්තන්.

(3) පහත දැක්වෙන තැනැත්තන් හට දුරස්ථ ස්ථානයක සහභාගී වීමට හිමිකම් ලැබිය යුතු ය:-

(අ) කොමසාරිස්වරයා සහ කොමසාරිස්වරයාට සහාය වන යම් තාක්ෂණික නිලධරයකු;

(ආ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබාදීම හෝ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා පැමිණීම නියමිත සාක්ෂිකරුවකු; සහ

(ඇ) අධිකරණය විසින් අවසර ලබා දෙන ලද නිරීක්ෂකයකු.

කොමසාරිස්වරයාගේ සහ උසාවි නිලධරයාගේ කාර්ය

**167ඕ.** (1) දුරස්ථ ස්ථානයේ සාක්ෂිකරුගේ පැමිණීම සහතික කිරීම සහ ඒ සම්බන්ධ කාරණා ඇතුළුව නමුත් එයට සීමා නොවී සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා දීම සඳහා පහසුකම් සැලසීම සඳහා උසාවි නිලධරයා සමඟ සම්බන්ධීකරණය කොට අවශ්‍ය සියලු ප්‍රායෝගික වැඩපිළිවෙළ යෙදීම සඳහා කොමසාරිස්වරයා වගකියනු ලැබිය යුතු ය.

(2) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සිදුවන සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි විභාග කිරීම අතරතුර විනිශ්චයකාරවරයා විසින් නිකුත් කරන ලද සියලු විධානවලට අනුකූල වන බවට සහතික වීම සහ දුරස්ථ ස්ථානයේ දී වෙනත් කිසිදු පටිගත කිරීමක් සිදු නොවන බවට සහතික වීම කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(3) 167ක වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය මගින් සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම යම් තැනැත්තකු විසින් පටිගත නොකළ යුතු ය.

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා දුරස්ථ ස්ථානයක පිහිටි තැනක සිට සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම අතරතුර ගත යුතු ආරක්ෂණ පියවර

**167ක.** (1) කොමසාරිස්වරයකු පත් කර නොමැති නම් හැර, විනිශ්චයකාරවරයා විසින් කොමසාරිස්වරයාගේ සහාය ඇතිව, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි විභාග කිරීමට නියමිත සාක්ෂිකරුගේ අනන්‍යතාවය තහවුරු කර ගත යුතු අතර, සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සඳහා වන නීතිය, අධිකරණයේ පරිචය සහ කාර්යපටිපාටිය ප්‍රකාරව දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ලබාගත යුතු ය.

(2) දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකු විසින් ලබා දුන් දිවුරුම හෝ ප්‍රතිඥාව සහ එසේ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත ලබා දුන් සාක්ෂි, අධිකරණයට අපහාස කිරීමේ කාර්යය සඳහා ඇතුළු ව අධිකරණයේ භෞතිකව සිදු කරන නඩු කටයුත්තක දී පෙනී සිටිමින් ලබා දෙන්නා වූ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මෙන් සමාන ආකාරයෙන් සිදු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා ලබා දුන් සාක්ෂිකරුවකුගේ වාචික සාක්ෂිය අධිකරණයේ දී භෞතිකව පවත්වන ලද යම් නඩු කටයුත්තක ආකාරයෙන් ම විනිශ්චයකාරවරයා විසින් හෝ ඔහු ඉදිරිපිට දී අධිකරණ ස්ථානයේ දී ලිඛිතව වාර්තාගත කරනු ලැබිය යුතු අතර, සාක්ෂිකරුවකු හෝ සාක්ෂි විභාග කිරීම විනිශ්චයකාරවරයාගේ ලිඛිත විධානයක් යටතේ අධිකරණ ස්ථානයේ දී ඉලෙක්ට්‍රොනිකව වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(4) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම අධිකරණයේ සාමාන්‍ය රාජකාරි වේලාව තුළ සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වන පරිදි අධිකරණය විසින් සාක්ෂිකරුවකුගේ සාක්ෂි ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා විභාග කිරීමේ වේලාවන් සම්බන්ධයෙන් සුදුසු විධානයන් සිදු කරනු ලැබිය හැකි ය.

(5) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සිදු කරන නඩු කටයුතු අතරතුර දී අධිකරණ ස්ථානය සහ දුරස්ථ ස්ථානය විධිමත් අධිකරණයක් විය යුතු අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීමට අදාළව ප්‍රොටොකෝල දක්වමින් රීති සාදනු ලැබිය හැකි ය.

අධිකරණයේ සාමාන්‍ය පරිචයට අනුකූලව සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම

**167ග.**(1) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම හැකිතාක් දුරට අධිකරණයේ සාමාන්‍ය පරිචයට අනුකූලව පවත්වනු ලැබිය යුතු අතර, (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ

විධිවිධාන සහ සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා දීම සඳහා විධිවිධාන සලස්වන තත්කාලයේ බලපවත්නා වෙනත් ලිඛිත නීතියක් මේ සංග්‍රහයේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට අදාළ විය යුතු ය.

(2) අධිකරණය විසින් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා නඩු කටයුතු අතරතුර දී සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක තාක්ෂණය සහ සහභාගී වන්නන්ගේ භූගෝලීය වශයෙන් වෙන්වීම මගින් නිර්මාණය කරන ලද වෙනස් වූ පරිසරය සැලකිල්ලට ගෙන සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා දීම සාධාරණ සහ අපක්ෂපාතී නඩු විභාගයකට හෝ පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් බාධා කිරීමක් හෝ ඒවා අහිමි කිරීමක් සිදු නොවන බවට සහතික වීම සඳහා විධාන කරනු ලැබිය හැකි ය.

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය බිඳ වැටීම

**167ච.** සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සිදුවන නඩු කටයුත්තක් අතුරතුර යම් තාක්ෂණික බාධා වීමක් ඇතිවන අවස්ථාවක දී, අධිකරණ නිලධරයා සහ කොමසාරිස්වරයා විසින් එම බාධා වීම වහාම නිවැරදි කර සම්බන්ධතාවය යථා තත්ත්වයට පත් කිරීමට සියලු උත්සාහයන් ගනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින්, එම බාධා වීම අතරතුර දී දුරස්ථ ස්ථානයේ සිටින සාක්ෂිකරු අනෙක් සහභාගීවන්නන් සමඟ සන්නිවේදනය නොකරන බවට වගබලාගත යුතු අතර, සම්බන්ධතාවය යථා තත්ත්වයට පත් කළ පසු වහාම එම බාධා වීම අතරතුර සාක්ෂිකරු වෙනත් සහභාගීවන්නන් සමඟ සන්නිවේදනය කිරීම වැළැක්වීම සඳහා සහ ඔවුන්ගේ සංචලතාවය සීමා කිරීම සඳහා හැකිතාක් දුරට සියලු පියවර ඔහු විසින් ගෙන ඇති බවට අධිකරණ ස්ථානයේ සිටින විනිශ්චයකාරවරයාට දැනුම් දිය යුතු ය.

නඩු කටයුතුවලට බාධා වීම

**167ජ.** (1) නඩු කටයුතු අතරතුර දී සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය බිඳ වැටී තාක්ෂණික දෝෂය කඩිනමින් නිවැරදි කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අධිකරණය විසින් නඩු කටයුතු කල් තැබීම හෝ නඩු කටයුතු අත්හිටුවීම සහ නැවත සැලසුම් කිරීම ඇතුළුව අවස්ථානුගත කරුණුවල දී සුදුසු වන වෙනත් යම් ආඥා සිදු කිරීම කළ හැකි ය.

(2) විනිශ්චයකාරවරයා, තමා විසින් ම හෝ කොමසාරිස්වරයාගේ ඉල්ලීම මත හෝ බාධා වීමට ඉක්බිතිව ම පාර්ශ්වයක් විසින් කරන ලද ඉල්ලීම මත තාක්ෂණික බාධා වීම හේතුවෙන් සාක්ෂි ලබා දීමට අහිතකරව බලපෑම් වී ඇති බවට සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින්, සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීම වහාම අවලංගු කරනු ලැබිය හැකි අතර, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීම අලුතින් ම සිදු කිරීම හෝ අධිකරණය තුළ භෞතිකව සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීම සිදු කරන ලෙසට විධාන කිරීම සිදු කළ හැකි ය.

(3) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය බිඳ වැටීම හේතුවෙන් කල්තැබීමක් සිදු වන අවස්ථාවක දී, අධිකරණය විසින් වියදම් සම්බන්ධයෙන් සාධාරණ විය හැකි පරිදි ආඥාවක් සිදු කරනු ලැබිය හැකි ය.

දුරස්ථ ස්ථානයක සිටින තැනැත්තකුට ලේඛන හුවමාරු කිරීම

**167ට.** 167ඒ වන සහ 167ඕ වන වගන්තිවල සඳහන් කරන ලද කාර්යපටිපාටියට අමතරව, දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සිදුවන නඩු කටයුතු අතරතුර දී, දුරස්ථ ස්ථානයක සිටින සාක්ෂිකරු වෙත ලේඛනයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන්නේ නම් අදාළ වන නීතියට සහ කාර්යපටිපාටියට යටත්ව පහත දැක්වෙන ආකාරයට ලේඛනය

සාක්ෂිකරු වෙත ඉදිරිපත් කිරීමට අධිකරණය විසින් අවසර ලබා දෙනු ලැබිය හැකි ය:-

(අ) ලේඛනය අධිකරණ ස්ථානයේ තිබේ නම්, ලේඛන දෘශ්‍යකරණ උපකරණයක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික ආකාරයක් භාවිත කිරීම මගින් සාක්ෂිකරු වෙත ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ නිලධරයා විසින් ඒ ලේඛනයේ පිටපතක් කොමසාරිස්වරයා වෙත ඉලෙක්ට්‍රොනිකව සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය;

(ආ) (i) ලේඛනය දුරස්ථ ස්ථානයේ තිබේ නම්, ලේඛන දෘශ්‍යකරණ උපකරණයක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික ආකාරයක් භාවිත කිරීම මගින් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් ඒ ලේඛනයේ පිටපතක් අධිකරණ නිලධරයා වෙත සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය;

(ii) ඒ ලේඛනයේ සහතික කරන ලද දෘඪ පිටපත වහාම කොමසාරිස්වරයා වෙත භාරදිය යුතු අතර කොමසාරිස්වරයා විසින් ඒ ලේඛනය ලියාපදිංචි තැපැල හෝ කුරියර් මගින් අධිකරණය වෙත සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

නඩු කටයුතුවල දී සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව

**167ඩ.** ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා

සිදුවන නඩු කටයුතු අතරතුර දී සාක්ෂිකරුවකුට අධිකරණයේ භෞතිකව සිදු කරනු ලබන නඩු කටයුත්තක සාක්ෂිකරුවකු වශයෙන් තිබිය යුතු ආරක්ෂාවට සමාන අරක්ෂාවක් ම තිබිය යුතු ය.

සාක්ෂි ලබා දීම සඳහා සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය භාවිත කිරීම සඳහා වන වියදම්

**167ණ.**(1) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකු විසින් සාක්ෂි ලබා දීම කළ යුතු බවට අධිකරණය විසින් ස්වකීය මෙහෙයවීමෙන් ම විධාන කරනු ලබන අවස්ථාවක දී, අධිකරණය විසින් අන්‍යාකාරයෙන් විධාන කරන්නේ නම් මිස, ඒ ශ්‍රව්‍ය දෘශ්‍ය නඩු විමසීම සඳහා වන පිරිවැය අධිකරණය විසින් දැරිය හැකි ය.

(2) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා දීමට සාක්ෂිකරුවකු කැඳවීමට අපේක්ෂා කරනු ලබන පාර්ශ්වයක් විසින් වෙනත් ආනුෂංගික වියදම් ඇතුළුව ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවෙකුගේ සාක්ෂි විභාග කිරීමක වියදම් ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් විරුද්ධ පාර්ශ්වයක් විසින් පත් කරන ලද යම් නිරීක්ෂකයකු සඳහා වන වියදම් සහ හරස් ප්‍රශ්න ඇසීම සඳහා දුරස්ථ ස්ථානය වෙත ලේඛන යැවීමේ වියදම් ද ඒ විරුද්ධ පාර්ශ්වය විසින් දරනු ලැබිය යුතු ය.

(3) (අ) සජීවී තාක්ෂණික අධිකරණ ශාලාව හෝ අධිකරණ පරිශ්‍රයේ ස්ථාපනය කරන ලද අධිකරණයේ තාක්ෂණික සේවාව හෝ දායක මුදල් ගෙවීමේ පදනමක් මත වෙනත් සේවා සපයන්නකු විසින් සපයන ලද වෙනත් තාක්ෂණික සේවාවක් හෝ යම් අධිකරණයක පවතින අවස්ථාවක දී, අධිකරණය විසින් ශ්‍රී ලංකාව තුළ සමකාලීන

ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය භාවිත කිරීම සඳහා වන වියදම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් අත්හරිනු ලැබිය හැකි ය.

(ආ) (අ) වන ඡේදය යටතේ අධිකරණය විසින් වියදමින් කොටසක් අත්හරිනු ලබන අවස්ථාවක දී, වියදම් ගණනය කරන ක්‍රමය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) ලේඛනය ඔප්පු කිරීම පිළිබඳ සාක්ෂි මෙහෙයවීමෙන් පසුව අධිකරණය විසින් එම ලේඛනය පිළිගනු ලැබුවහොත් වාර්තාගත කළ යුතු යහපත් හේතුවක් මත අධිකරණය විසින් අන්‍යාකාරයකට විධානය කරන්නේ නම් මිස, ලේඛනය අභියෝගයට ලක් කළ පාර්ශ්වය විසින් තක්සේරු ගාස්තු ගෙවීමට අමතරව ලේඛනය ඔප්පු කිරීමේ දී දරන ලද වියදම් ගෙවීම සඳහා යටත් වනු ලැබිය යුතු ය.

අධිකාර පත්‍රය ආපසු භාරදීම

**167ත.** අධිකාර පත්‍රය යථා පරිදි ක්‍රියාත්මක කිරීමෙන් පසුව, කොමසාරිස්වරයාගේ නම සහ අත්සන සහිත ඔහුගේ ලිඛිත වාර්තාව සහ අධිකරණය විසින් කරන ලද විධාන සහ අධිකරණය විසින් කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලද විධානවලට අනුකූලව කටයුතු කිරීමට ඔහු විසින් ගන්නා ලද පියවර ද සමඟ ඒ අධිකාර පත්‍රය කොමසාරිස්වරයා විසින් අධිකරණය වෙත ආපසු භාරදෙනු ලැබිය යුතු ය.

දුරස්ථ ස්ථානයේ සිටින සාක්ෂිකරුගේ සාක්ෂි වාර්තාවේ පිටපත් සහ වීඩියෝ පටිගත කිරීමේ සහතික කළ පිටපත් සඳහා වන ඉල්ලීම

**167ද.** (1) 167ජ වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, 167ක වන වගන්තිය ප්‍රකාරව වාර්තාගත කරන ලද සාක්ෂි, සාක්ෂි විභාගයේ නිල වාර්තාව විය යුතු අතර නඩු කටයුතුවල උද්ධෘතයක් ලබා ගැනීමට නඩුවේ ඕනෑම පාර්ශ්වයකට හිමිකම තිබිය යුතු ය.

(2) නඩු කටයුතුවල උද්ධෘතයෙහි දත්ත කේතගත කරන ලද මුල් පිටපත රෙජිස්ට්‍රාර්වරයා විසින් නඩු වාර්තාවෙහි කොටසක් ලෙස වෙනම අධිකරණයේ ඩිජිටල් සර්වරයෙහි රඳවා තබා ගනු ලැබිය යුතු අතර දත්ත කේතගත කරන ලද උපස්ථ පිටපතක් වෙනත් ආරක්ෂිත ස්ථානයක තැබිය යුතු ය.

(3) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීමක් අතරතුර දී පාර්ශ්වයක් විසින් යම් දෙයක් වරප්‍රසාදිත හෝ රහස්‍ය ලෙස සලකනු ලබන ලෙස දක්වා සිටින අවස්ථාවක දී, අධිකරණය විසින් ඒ සම්බන්ධයෙන් සුදුසු විධාන සිදු කරනු ලැබිය යුතු ය.

(4) ඉල්ලීමක් මත අධිකරණයේ රඳවාගෙන ඇති සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීමක් හරහා සිදු වූ නඩු කටයුතුවල උද්ධෘතයෙහි මුල් පිටපත බැලීමට පාර්ශ්වයකට අවසර ලැබිය හැකි අතර මුල්පිටපත රෙජිස්ට්‍රාර්වරයා හෝ අධිකරණය විසින් නම් කරනු ලබන නිලධරයකු ඉදිරිපිට දී පමණක් බැලිය හැකි වීම ඇතුළුව, කොන්දේසිවලට යටත්ව, එක් එක් අවස්ථාව මත පදනම්ව විනිශ්චයකාරවරයා විසින් එවැනි ඉල්ලීමක් පිළිබඳව තීරණය කරනු ලැබිය යුතු ය.

(5) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම හරහා සිදුවන නඩු කටයුතුවල උද්ධෘතයෙහි මුල් පිටපතෙහි පිටපතක් හෝ උපස්ථ පිටපතක් අධිකරණය විසින් කිසිදු පාර්ශ්වයකට නිකුත් නොකළ යුතු ය.

දුරස්ථ ස්ථානයේ පිහිටි තැන හෝ පරිශ්‍රය අධිකරණයේ කොටසක් වශයෙන් සැලකිය යුතු බව

**167න.** (1) මේ සංග්‍රහය යටතේ යම් නඩු කටයුතුවල දී සාක්ෂිකරුවකුගේ සාක්ෂි ලබාදීමේ කාර්යය සඳහා සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය භාවිත කරනු ලබන දුරස්ථ ස්ථානයේ පිහිටි තැන මේ සංග්‍රහය යටතේ නඩු කටයුතු පැවැත්වීමේ කාර්යය සඳහා අධිකරණ ශාලාවක් හෝ වෙනත්

ස්ථානයක අධිකරණ කටයුතු පවත්වන ශ්‍රී ලංකාවේ අධිකරණයේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතාවය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීමක් අතරතුර දී දුරස්ථ ස්ථානයේ දී සිදු කරන ලද යම් වරදක්, ශ්‍රී ලංකාවේ බලාත්මකව පවතින නීතිවල කාර්යය සඳහා අධිකරණ ශාලාවේ දී හෝ අධිකරණ කටයුතු පවත්වනු ලබන වෙනත් ස්ථානයක දී සිදු කරන ලද වරදක් ලෙස සලකනු ලැබිය යුතු අතර සාක්ෂි, කාර්ය පටිපාටිය, අධිකරණයට අපහාස කිරීම සහ බොරු සාක්ෂි ලබා දීම සම්බන්ධයෙන් අදාළ වන නීති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා අධිකරණයක් විසින් පවත්වනු ලබන සියලු නඩු කටයුතු අධිකරණ නඩු කටයුතු විය යුතු අතර සාදන ලද නියෝගවල ඇති ප්‍රොටොකෝලයන් ද ඇතුළුව, භෞතිකව අධිකරණයක් තුළ පවත්වන නඩු කටයුතුවලට අදාළ වන සියලු අවසරයන් සහ පරිචයන් මේ නඩු කටයුතු සඳහා අදාළ විය යුතු ය.

නියෝග

**167ප.** අමාත්‍යවරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟතාවය ඇතිව පහත දැක්වෙන කාරණා සඳහා මේ සංග්‍රහයේ 840 වන වගන්තිය යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය :-

(අ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකු සාක්ෂි ලබා දිය යුතු අවස්ථාවක දී භාවිත කළ යුතු උපකරණ වර්ගය සහ තාක්ෂණික ක්‍රමවේදය, සහ සලස්වනු ලැබිය යුතු වැඩපිළිවෙළ නියම කරමින්;

(ආ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයේ වියදම් ගණනය කිරීමේ ක්‍රමවේදය සහ නඩු කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය සැපයීම වෙනුවෙන් යම් බාහිර සේවා සැපයුම්කරුවකුට කළ යුතු යම් ගෙවීමක් තිබේ නම් එම ගෙවීම් ක්‍රමවේදය නියම කරමින්.

අර්ථ නිරූපණය

**167ඞ.** 167අ වන වගන්තියේ සිට මේ වගන්තිය දක්වා (ඒ වගන්ති දෙක ද ඇතුළුව) වන වගන්තිවල කාර්යය සඳහා -

"මධ්‍යම අධිකාරිය" යන්නෙන්, අධිකරණ විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් අදහස් වේ;

"සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය" යන්නෙන්-

(අ) අධිකරණ ස්ථානයේ සිට නඩු කටයුතුවලට සහභාගී වන තැනැත්තන්ට, සාක්ෂි ලබා දෙනු ලබන දුරස්ථ ස්ථානයක සිට නඩු කටයුතු සඳහා සහභාගී වන වෙනත් සියලු ම තැනැත්තන් දැකීමට සහ ඇසීමට හැකි කරවන; සහ

(ආ) දුරස්ථ ස්ථානයක සිට නඩු කටයුතුවලට සහභාගී වන සියලු ම තැනැත්තන්ට, අධිකරණ ස්ථානයේ සිට නඩු කටයුතුවලට සහභාගී වන තැනැත්තන් දැකීමට සහ ඇසීමට හැකි කරවන,

යම් තාක්ෂණික පහසුකමක් අදහස් වේ;

''කොමසාරිස්වරයා'' යන්නට, 167ආ වන, 167ඇ වන හෝ 167ඇ වන වගන්තිවල විධිවිධාන යටතේ අධිකරණය විසින් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා දුරස්ථ ස්ථානයක සිට සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කරනු ලැබිය යුතු කොමසාරිස්වරයකු වශයෙන් පත් කරන ලද තැනැත්තකු ඇතුළත් වේ;

''උසාවි නිලධරයා'' යන්නට, විනිශ්චයකාරවරයා විසින් නම් කරන ලද සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා දුරස්ථ ස්ථානයක සිට සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කරනු ලබන අධිකරණ ස්ථානයේ කටයුතු කරන යම් රෙජිස්ට්‍රාර්වරයකු හෝ අධිකරණ නිලධරයකු අදහස් වේ;

''අධිකරණ ස්ථානය'' යන්නට, භෞතිකව රැස් වී සාම්ප්‍රදායික ආකාරයෙන් හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය මඟින් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විභාග කරනු ලබන අධිකරණ ශාලාව අදහස් වේ;

''ලේඛනය'' යන්නට, මේ සංග්‍රහයේ හෝ බලාත්මකව පවතින වෙනත් යම් ලිඛිත නීතියක අර්ථානුකූලව ඉලෙක්ට්‍රොනික ආකාරයේ යම් ලේඛනයක් ඇතුළත් වේ;

''රජයේ ආයතනයක සේවානියුක්තයා'' යන්නෙන්, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතාවය හරහා සාක්ෂි ලබා දීම සම්බන්ධයෙන් වන විට දී -

(අ) නඩු කටයුතුවල දී හෝ යෝජිත නඩු කටයුතුවල දී සාක්ෂි වශයෙන් භාවිත කිරීම සඳහා වන විශේෂඥ වාර්තාවක් සපයන්නා වූ හෝ නඩු කටයුතුවලදී මතයන් සම්බන්ධයෙන් වන සාක්ෂි ලබා දීම සඳහා විශේෂඥයකු ලෙස කැඳවන්නා වූ යම් රජයේ ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු හෝ යම් රජයේ ආයතනයක සේවයේ නියුතු හෝ යම් රජයේ ආයතනයක් විසින් සම්බන්ධ කරගෙන ඇති තැනැත්තකු; සහ

(ආ) යම් රජයේ ආයතනයක් භාරයේ ඇති ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ තහවුරු කිරීමට කැඳවන ලද එම රජයේ ආයතනයේ සාමාජිකයකු,

අදහස් වේ;

“රජයේ ආයතනය” යන්නට ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යාලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තු මහලේකම්වරයා,

ආණ්ඩුවේ අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක්, යම් පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක්, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාරයක් හෝ වෙනත් ව්‍යාපාරයක්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රතිශතයක් රජය, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගමක් සහ ආණ්ඩුව හෝ පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් හිමිකම් දරන හෝ පාලනය කරනු ලබන යම් රෝහලක්, සෞඛ්‍යය සේවා පහසුකමක්, සායනයක්, ආබාධිත තැනැත්තන් සඳහා වන මධ්‍යස්ථානයක්, රැඳවුම් මධ්‍යස්ථානයක්, බන්ධනාගාරයක්, ළමා නිවාසයක්, රැකවරණ නිවාසයක්, ආරක්ෂිත නිවාසයක්, ළමා සුරැකුම් මධ්‍යස්ථානයක්, රිමාන්ඩ් නිවාසයක් හෝ ළමයින් හෝ තරුණ වරදකරුවන්ගේ රැකවරණය, ආරක්ෂාව හෝ භාරකාරත්වය සඳහා වන යම් මධ්‍යස්ථානයක්, නිවාසයක් හෝ පාසලක් ද ඇතුළත් වේ;

“අමාත්‍යවරයා” යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ අධිකරණ විෂයය පවරන ලද අමාත්‍යවරයා අදහස් වේ;

“පටිගත කිරීම” යන්නෙන් -

(අ) තනි රූපයක්, චලනය වන රූපයක් හෝ යම් ශබ්දයක්; හෝ

(ආ) තනි රූපයක්, චලනය වන රූපයක් හෝ ශබ්දයක් නිපදවිය හැකි හෝ ප්‍රති නිපදවිය හැකි, යම් මාධ්‍යයකින් කරන ලද පටිගත කිරීමක්,

අදහස් වේ;

“දුරස්ථ ස්ථානය” යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා නඩු කටයුතු සඳහා සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරු සිටින ස්ථානය අදහස් වේ;

“තාක්ෂණික බාධාව” යන්නට, මන්දගාමී සම්ප්‍රේෂණ වේගයට හෝ දුර්වල ශ්‍රව්‍ය දෘශ්‍ය ගුණාත්මකභාවයට හේතුවන යම් උපාංග හෝ ජාල බිඳ වැටීමක් හෝ යම් වෙබ් අඩවියක හෝ සේවය සපයන්නාගේ දෝෂයක් ඇතුළත් වේ;

“තාක්ෂණික සජීවී අධිකරණ ශාලාව” යන්නෙන්, දුරස්ථ ස්ථානයේ පවත්වනු ලබන හෝ දුරස්ථ ස්ථානයේ පිහිටි වෙනත් යම් තැනක් සමඟ සම්බන්ධ වී විකාශය කරනු ලබන නඩු කටයුතු බැලීම සහ ඇසීම සඳහා මහජනතාවට හෝ අධිකරණ භාවිතකරුවන්ට හැකි කරවන අධිකරණ ශාලාව අදහස් වේ;

“සම්ප්‍රේෂණය” යන්නෙන්, තනි රූපයක්, චලනය වන රූපයක් හෝ යම් ශබ්දයක් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් යැවීමක් අදහස් වේ.”.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනයේ අංක 39 වන ආකෘතියට (සිතාසියකට අකීකරු වීම ගැන සාක්ෂිකරුවකුට විරුද්ධව නිකුත් කරනු ලබන සිරභාරයට ගැනීමේ වරෙන්තුවේ ආකෘතිය) ඉක්බිතිව ම පහත අලුත් ආකෘති ඇතුළත් කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ -

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

"අංක 39 අ

**සම කාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා වන අධිකාර පත්‍රය**

[167ආ(8) වන වගන්තිය]

................................මහාධිකරණයෙහි/දිසා අධිකරණයෙහි දී ය.
නඩු අංක ...............................

..................................
පැමිණිලිකරු
එරෙහිව
...................................
විත්තිකරු

.......................................................................හි(කොමසාරිස්වරයා වශයෙන් පත් කළ යුතු තැනැත්තාගේ ලිපිනය) ............................................. ............. (කොමසාරිස්වරයා වශයෙන් පත් කළ යුතු තැනැත්තාගේ නම) වෙත.

................................................ නීතියේ (අදාළ වන නීතිය) විධිවිධාන යටතේ .......................... (නඩුවේ ස්වභාවය) සඳහා ඉහත නම් කරන ලද විත්තිකරුට/ විත්තිකරුවන්ට එරෙහිව ඉහත නම් කරන ලද පැමිණිලිකරු විසින් ඉහත ආකාරයේ නඩුවක් ගොනු කර ඇති හෙයින් ද;

පහත සඳහන් සාක්ෂිකරුගේ සාක්ෂි ලබා දීම, පටිගත කිරීම සහ සාක්ෂි විභාග කිරීම දුරස්ථ ස්ථානයක පිහිටි තැනක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා කළ හැකි බවට අවසර ලබා දීමට නඩුවේ පාර්ශ්වයන්/ පැමිණිලිකරු/ විත්තිකරු විසින් අධිකරණයෙන් ආයාචනය කර/අධිකරණය ස්වකීය මෙහෙයවීමෙන් ම තීරණය කර ඇති හෙයින් ද;

සාක්ෂිකරුගේ නම: ...............................................................................................

ජා. හැ. අංකය/ විදේශ ගමන් බලපත්‍ර අංකය: ....................................................

ලිපිනය: .............................................................................................................

සම්බන්ධ කර ගත හැකි විස්තර: .......................................................................

ඉහත සඳහන් සාක්ෂිකරුගේ සාක්ෂි සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා විභාග කිරීම පහත දැක්වෙන දුරස්ථ ස්ථානයේ සිට අධිකරණ ස්ථානය සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා මේ අධිකරණය විසින් කොමසාරිස්වරයකු ලෙස ඔබ පත් කර ඇති හෙයින් ද;

දුරස්ථ ස්ථානයේ ලිපිනය: ..................................................................................

මේ අධිකරණය විසින් දැනුම් දෙනු ලබන දිනයේ දී සහ වේලාවේ දී සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා ඉහත සඳහන් සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කර මෙහි අමුණා ඇති අංක 39ඇ ආකෘතියට සාරානුකූලව දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ගෙන අත්සන් කර හෝ සාදා අත්සන් කර, ඒ දිවුරුමේ හෝ ප්‍රතිඥාවේ පිටපතක් අධිකරණය වෙත වහාම ආපසු දීම සඳහා ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සහ ඒ දිවුරුමේ හෝ ප්‍රතිඥාවේ මුල් පිටපත .............................. (රෙජිස්ට්‍රාර්වරයාගේ විද්‍යුත් තැපැල් ලිපිනය) හරහා මේ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට සාක්ෂි ලබා දීම සම්පූර්ණ කිරීමෙන් දින 14 ක් ඇතුළත එවීම සඳහා ඔබ වෙත මෙයින් ආඥා කර සිටිනු ලැබේ.

...................................... මස .................................... වන දින දී ය.

අධිකරණයේ ආඥාව පරිදි,

(අත්සන් කළේ) ......................................,

රෙජිස්ට්‍රාර්වරයා.

අධිකාර පත්‍රය සකස් කරනු ලැබුවේ මා විසින්,

(පැමිණිලිකරු/විත්තිකරු සඳහා ලියාපදිංචි නීතීඥවරයා)

**අංක 39ආ**

**(ශ්‍රී ලංකාව ඇතුළත දුරස්ථ ස්ථානයක කොමසාරිස්වරයා වෙත අධිකාර පත්‍රය ලබා දීම)**

**සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා අධිකාර පත්‍රය ලබා දීම.**

[167ඊ(1)(අ)]

.......................................... මහාධිකරණයෙහි/ දිසා අධිකරණයෙහි දී ය.

නඩු අංක ..........................................

...................................

පැමිණිලිකරු

එරෙහිව

.....................................

විත්තිකරු

............................................................ හි (කොමසාරිස්වරයා‍ගේ ලිපිනය)

.................................................................. (කොමසාරිස්වරයා වශයෙන් පත් කළ යුතු තැනැත්තාගේ නම) වෙත.

සඳහන් කරනු ලබන දිනයේ දී සහ වේලාවේ දී සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා පහත සඳහන් සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා ඔබ වෙත මෙයින් බලය පවරා සිටිනු ලැබේ:-

සාක්ෂිකරුගේ විස්තර:

නම: ..........................................................................................................

ජා. හැ. අංකය/ විදේශ ගමන් බලපත්‍ර අංකය: ....................................................

දුරස්ථ ස්ථානයේ ලිපිනය: ...........................................................................

දුරස්ථ ස්ථානය සම්බන්ධ කර ගැනීම සඳහා වන විස්තර: .................................

විභාග කිරීමේ දිනය සහ වේලාව:..............................................................

අධිකරණ ස්ථානය සම්බන්ධ කර ගැනීමේ විස්තර:...........................................

අමුණන ලද ලේඛන:........................................................................

අධිකරණයේ ආඥාව පරිදි,

(අත්සන් කළේ) .................................

රෙජිස්ට්‍රාර්වරයා.

**අංක 39ඇ**

**(ශ්‍රී ලංකාව ඇතුළත දුරස්ථ ස්ථානයක කොමසාරිස්වරයා වෙත අධිකාර පත්‍රය ලබා දීම)**

**සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා අධිකාර පත්‍රය ලබා දීම.**

[167ඊ(1)(ආ)]

වෙත : අධ්‍යක්ෂ/ නීති අංශය
විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ 01

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ/ මහ කොමසාරිස් කාර්යාලයේ/ කොන්සල් කාර්යාලයේ රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකු වෙත හෝ මධ්‍යම අධිකාරිය හරහා නම් කරන ලද තැනැත්තකු වෙත අධිකාර පත්‍රයක් ලබා දීම සම්බන්ධයෙන් වන ඉල්ලීම.**

ලේඛන සමඟ අමුණා ඇති අධිකාර පත්‍රය ................... තානාපති කාර්යාලයේ/ මහ කොමසාරිස් කාර්යාලයේ/ කොන්සල් කාර්යාලයේ නිසි පරිදි පත් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික නිලධරයා වෙත හෝ මධ්‍යම අධිකාරිය හරහා නම් කරන ලද තැනැත්තා වෙත භාර දෙන ලෙස සහ මේ ආකෘති පත්‍රයේ පිටපතක්, මෙහි පිටසන් කරන ලද සහ ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ/ නීති විසින් අත්සන් කරන ලද භාර දීමේ ප්‍රකාශය සමඟ ............................. අධිකරණය වෙත වාර්තා කරන ලෙස, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ/ නීති වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

............................................ මහාධිකරණයෙහි/ දිසා අධිකරණයෙහි දී ය.
නඩු අංක ...........................................

...................................
පැමිණිලිකරු

එරෙහිව

.....................................
විත්තිකරු

..........................................................................හි (කොමසාරිස්වරයාගේ ලිපිනය)
.................................................................... (කොමසාරිස්වරයා වශයෙන් පත් කළ යුතු තැනැත්තාගේ නම) වෙත.

සඳහන් කරනු ලබන දිනයේ දී සහ වේලාවේ දී සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා පහත සඳහන් සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා ඔබ වෙත මෙයින් බලය පවරා සිටිනු ලැබේ:-

සාක්ෂිකරුගේ විස්තර:

නම: ..............................................................................................................

ජා. හැ. අංකය/ විදේශ ගමන් බලපත්‍ර අංකය: ....................................................

දුරස්ථ ස්ථානයේ ලිපිනය: ...............................................................................

දුරස්ථ ස්ථානය සම්බන්ධ කර ගැනීම සඳහා වන විස්තර: ..................................

විභාග කිරීමේ දිනය සහ වේලාව: ....................................................................

අධිකරණ ස්ථානය සම්බන්ධ කර ගැනීමේ විස්තර: ..........................................

අමුණන ලද ලේඛන: .........................................................................................

අධිකරණයේ ආඥාව පරිදි,

(අත්සන් කළේ) .................................

රෙජිස්ට්‍රාර්වරයා.”.

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව